www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද මිලිටරිවාදය කලාපීය යුද ගිනි මුදා හැරීමට තර්ජනය කරයි

## US militarism threatens to unleash regional conflagration

**බිල් වාන් ඕකන් විසිනි**
**2007 ඔක්තෝබර් 23**

"තුන් වන ලෝක යුද්ධය මග හැරීමට උනන්දු වන" රටවල් ඉරානයට එරෙහිව තීව්‍ර කෙරෙන වොෂින්ටනයේ තර්ජනයන් සමග පෙල ගැසී ගත යුතු බවට පසු ගිය සතියේ ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් කල අනතුරු ඇඟවීම පසුපසින් පවතින්නේ, මැද පෙරදිග සහ මධ්‍යම ආසියාවේ පුලුල් බිම් තීරුවක් අලලා ගත්, සන්නද්ධ ප්‍රචන්ඩත්වයේ අනතුර සහ සැබවින් ම කිව හොත්, නව ලෝක යුද්ධයක තර්ජනය මතු කරමින් දිග හැරෙන වර්ධනයන් මාලාවකි.

ඇෆ්ඝනිස්ථානයෙහි සිදු කල එක්සත් ජනපද ආක්‍රමනයෙන් හය වසරකට සහ ඉරාකයෙහි සිදු කල ආක්‍රමනයෙන් වසර හතර හමාරකට පසුවත් මෙම රටවල් දෙකෙහි ම ගැටුම් දිගින් දිගට ම පැවතී ගෙන යාම සහ ගැඹුරු වීම මගින් ගිනිය නොහැකි පරිමානයක දේශපාලනික ප්‍රතික්‍රියා දාමයක් මුදා හැර තිබේ.

කලාපය තුල මූලෝපායාත්මක අවශ්‍යතාවන් පවතින අනෙකුත් ප්‍රධාන බලවතුන් ඇද ගැනීමට තර්ජනය කරමින් එය තුර්කිය, ඉරාකය, සිරියාව, ඉරානය, ඇෆ්ඝනිස්ථානය සහ පකිස්ථානය ඇතුලු බටහිරදිග පිහිටි යුරෝපයේ දේශ සීමාවල සිට නැගෙනහිරදිග පිහිටි ඉන්දියාව දක්වා විහිදෙන කලාපයක් තුල මිලිටරිමය ගැටුම අවුලුවමින් සිටී.

මිලියන සිය ගනනක් ජනයා මරුමුවට ඇද හෙළීමටත්, සැබවින් ම කිව හොත්, මුලු ග්‍රහලෝකය ම විනාශ කිරීමටත් තර්ජනය කරන සන්නද්ධ ඝට්ටන සඳහා වේදිකාව සැකසෙමින් තිබේ.

පුලුල් වන යුද්ධයක අනතුර මුලින් ම මතු කොට තිබෙන්නේ ඉරානයට විරුද්ධව ය. උපජනාධිපති රිචඩ් චෙනී සති අන්තය පුරා දිගින් දිගට ම ටෙහෙරානයට එරෙහි තර්ජනාත්මක වාගාලාප බිනී ය. ඒ අතරතුරේ සිරියාවට ද අපවාද සහ තර්ජන එල්ල කලේ ය.

"තමන් සිය වර්තමාන ගමන් පථයෙහි දිගින් දිගට ම රැඳී සිටිය හොත් බැරෑරුම් ප්‍රතිවිපාක පැනවීමට ජාත්‍යන්තර ප්‍රජාව සූදානමින් සිටින බව ඉරාන පාලන තන්ත්‍රය දැන ගත යුතු යැ"යි ඉරිදා කල කතාවක දී චෙනී මහතා පැවසී ය. "පැහැදිලි පනිවුඩයක් යැවීම සම්බන්ධයෙන් එක්සත් ජනපදය අනෙකුත් ජාතීන් සමග එක් වෙනවා: අප ඉරානයට න්‍යෂ්ටික අවියක් හිමි කර ගන්න ඉඩ දෙන්නෙ නැහැ." චෙනීගේ ප්‍රකාශය සිදු කෙරුනේ, ඉරාකයට එරෙහි ආක්‍රමනකාරී යුද්ධයේ ප්‍රධාන නිර්මාපකයන් සමහරෙකු ඇතුලත් ප්‍රකට බුද්ධි මන්ඩලයක් වන නැගෙනහිරදිග පිලිවෙත පිලිබඳ වොෂින්ටන ආයතනයේ රැස්වීමක් හමුවේ ය.

"ලෝකයේ පවතින, ත්‍රස්තවාදයට අනුග්‍රහ දක්වන වඩාත් ම ක්‍රියාකාරී රාජ්‍යය" ඉරානය යැයි හෙලා දුටු චෙනී "ත්‍රස්තවාදයට සහාය දෙන රාජ්‍යයක් තමන්ගේ ආක්‍රමනකාරී පරමාර්ථ සපුරා ගන්නා තෙක් අපේ රටට, සහ මුලු මහත් ජාත්‍යන්තර ප්‍රජාවට නිකම් බලා ඉන්න බැරි." බව කීවේ ය.

2002 අග භාගයෙහි ඉරාකයට එරෙහි එක්සත් ජනපද ආක්‍රමනයට සූදානම් වෙමින් සිටිය දී උපජනාධිපතිවරයා යොදා ගත් "මහපරිමාන ජනඝාතක අවි" පිලිබඳ වාගාලාපය ප්‍රතිරාව නැංවූ චෙනීගේ කතාව, ටෙහෙරාන ආන්ඩුව සිය න්‍යෂ්ටික වැඩ සටහන අඛන්ඩව පවත්වා ගෙන යාම අවහිර කිරීමේ මුවාවෙන් වොෂින්ටනය ඉරානයට මිලිටරිමය වශයෙන් පහර දීමට සූදානම් වෙමින් සිටින්නේ ය යන ඉතා පැහැදිලි ඇඟවුම දරා සිටියේ ය.

මෙම තර්ජන සිදු කෙරෙන්නේ මහජන ප්‍රතිරෝධය මර්දනය කිරීම සහ වලංගු රූකඩ ආන්ඩු බලයට පත් කිරීම සම්බන්ධයෙන් ඉරාකයේ දී හෝ ඇෆ්ඝනිස්ථානයේ දී වොෂින්ටනය සාර්ථකත්වය අත් කර ගත් තතු යටතේ නො වේ. සටන දිගින් දිගට ම තීව්‍ර වෙමින් පවතින රටවල් දෙක තුල සිදු කෙරෙන මිලිටරි මෙහෙයුම්වල වැය පියවා ගැනීම සඳහා තවත් එක්සත් ජනපද ඩොලර් බිලියන 46ක් ඉල්ලා සිටීමට සඳුදා බුෂ්ට බල කෙරුනි. මෙම ආයාචනයත් සමග ඔක්තෝබර් 1 වන දායින් ඇරඹුනු මූල්‍ය වර්ෂය සඳහා වෙන් කල මුලු මුදල් ප්‍රමානය එක්සත් ජනපද ඩොලර් බිලියන 196කි.

එක්සත් ජනපද මිලිටරිය දැනට මත් එරී සිටින මෙම නොහික්මුනු විජිතවාදී ශෛලියේ යුද්ධ හැර ගැලවිය හැකි වෙනත් මගක් නැතැයි යන නිගමනයට බුෂ් පාලනාධිකාරයත් සමස්ත ඇමරිකානු පාලක ප්‍රභූව මත් එලඹ සිටී. මෙම පැසවන ගැටුම්වල බලපෑම කලාපය පුරා තමන්ගේ ම ප්‍රවර්තන ශක්තියක් අත් කර ගනු ඇත. වොෂින්ටනය විසින් දැන් ලුහුබැඳ යන වඩාත් තීව්‍ර කිරීමේ පිලිවෙත තුල උමතු භාවයේ මූලයක් පවතින බවක් පෙනී ගිය ද ඊට යටින් පවතින්නේ එක්සත් ජනපදයේ සහ ලෝක ධනවාදයේ ඒකාබද්ධ අර්බුදයේ තර්කනය යි.

සඳුදා *නිව් යෝක් ටයිම්ස්* පුවත්පත විසින් ප්‍රසිද්ධ කරන ලද සම්මුඛ සාකච්ඡාවක ඒකාබද්ධ කාර්ය මන්ඩල ප්‍රධානීන්ගේ මන්ඩලයේ නව සභාපති කල සැඳහුම්වලින් පිලිබිඹු වූ පරිදි, පවත්නා යුද්ධ තව දුරටත් පුලුල් කෙරුන හොත් මිලිටරි අන දෙන්නන් තුල ම ගැඹුරු නොඉවසිලිමත් භාවයකට මුල පිරෙනු ඇත යන අපේක්ෂාව පවතී.

අඛන්ඩව මිලිටරිමය වැය ඉහල නැංවීමක් සඳහා පීඩනය යෙදීමට තමන් අදහස් කරන්නේ යැයි අවධාරනය කරන අතරතුරේ නව සභාපති අද්මිරාල් මයික් මුලන් මෙසේ අනතුරු ඇඟවී යෑ "අප මේ දැන් රටවල් දෙකක සිදු වන ගැටුමකට සම්බන්ධ වී සිටිනවා. ලෝකයේ ඒ කොටසේ පිහිටි තුන් වන රටක් එක්ක සැබවින් ම ගැටුමකට පිවිසෙන්න තියෙන ඉඩකඩ ගැන අතිශයින් ම කල්පනාකාරී වෙන්න අපට සිද්ධ වෙනවා."

## ඉරානය තුල සන්නද්ධ ප්‍රහාර

එහෙත් ඉරානය සම්බන්ධයෙන් ම ගත් කල, සන්නද්ධ පියවරයන් දැනට මත් ඇරඹී ඇති බවට ලැබෙන ඇඟවුම් වැඩෙමින් පවතී. බ්‍රිතාන්‍ය ආරක්ෂක අමාත්‍යාංශ මූලාශ්‍ර උපුටා දක්වමින් ඊයේ ලන්ඩන් *ටයිම්ස්* පුවත්පත , "ඉරාන විප්ලවීය ආරක්ෂක භටකායේ අල්-කුඩ්ස් විශේෂ බලකායන්ට එරෙහිව රහසිගත දේශ සීමා යුද්ධයක කොටසක් ලෙස බ්‍රිතාන්‍ය විශේෂ බලකායන් මෑත මාසවල දී කීප වතාවක් ඉරානයට ඇතුලු වී තිබෙන" බව වාර්තා කලේ ය.

පුවත්පතට අනුව, එක්සත් ජනපද සහ ඕස්ට්‍රේලියානු විශේෂ බලකා ඒකක සමග ඒකාබද්ධව මෙහෙයුම් කටයුතුවල යෙදෙන බ්‍රිතාන්‍ය එස්ඒඑස් කොමාන්ඩෝවරුන් දේශ සීමා ප්‍රදේශයේ දී ඉරාන බලකායන් සමග අඩු ගනනේ "තීව්‍ර වෙඩි හුවමාරු දොලහකට" සම්බන්ධ වී තිබේ. "ඉරානය තුල සිටින ඇමරිකානු විශේෂ මෙහෙයුම්වල නිලධර කන්ඩායම් ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා සූදානම් වෙමින් සිටින බවට නිරන්තරව වාර්තා ලැබෙමින් පවතින" බව *ටයිම්ස්* පුවත්පත සඳහන් කලේ ය.

කෙනෙකු සිතිය යුත්තේ මෙම විශේෂ බලකා ඒකකයක් ඉරානය තුල දී සහමුලින් විනාශයට පත් කෙරුන හොත් සිදු වනු ඇත්තේ කුමක් ද යන්න පමනකි. ඔවුන්ට ප්‍රහාර එල්ල කෙරුනේ දේශ සීමාවේ ඉරාක පාර්ශ්වයේ දී යැයි කියා සිටින බවත් ඒ අනුව එක්සත් ජනපද ප්‍රහාරයකට හේතු වන සිද්ධියක් සම්පාදනය වන බවත් ගැන කිසිදු සැකයක් නැත.

ඉරානය මත එක්සත් ජනපද ගුවන් ප්‍රහාර එල්ල කිරීමට ඉලක්ක සිතියම්ගත කිරීම සඳහා යොදා ගැනීමට සයිප්‍රසයෙහි සහ අබුඩාබියෙහි පිහිටි කඳවුරුවලට ඇමරිකානු යූ-2 ඔත්තු බැලීමේ ගුවන් යානා හතක් යලි යෙදවූ බව ද පුවත්පත වාර්තා කලේ ය.

මේ අතරතුර, පීකේකේ සංවිධානයේ කුර්දි බෙදුම්වාදී ගරිල්ලන් දශකයකට ආසන්න කාලයක් තුල දී ඔවුන් විසින් එල්ල කරන ලද වඩාත් ම ලේ වැකි ප්‍රහාරයක් සිදු කිරීමෙන් අනතුරුව හමුදා සහ අවිආයුධ ගෙන යන වාහන 50කින් පමන සමන්විත තුර්කි මිලිටරි රථ පෙලක් දේශ සීමා ප්‍රදේශයට යැවෙමින් පවතින බවට ලැබෙන වාර්තා සමගින් ඉරාක යුද්ධය ඉරාක-තුර්කි දේශ සීමාව ඔස්සේ ද පැතිර යාමට තර්ජනය කරයි. ඉරිදා සිදු කල මෙහෙයුමෙන් සොල්දාදුවන් 17 දෙනෙකු ඝාතනයට ලක් වූ අතර, තවත් අට දෙනෙක් පීකේකේය විසින් අල්ලා ගන්නා ලද බව වාර්තා විය.

මෑත ම සිදු වූ මෙම ප්‍රහාරයට කලින්, පසු ගිය සතියේ, ඉරාකයෙහි පවතින පීකේකේ කඳවුරුවලට පහර දීම සඳහා දේශ සීමාව හරහා හමුදා යැවීමට ආන්ඩුවට බලය පැවරෙන යෝජනාවකට පක්ෂව තුර්කි පාර්ලිමේන්තුව ඒකමතිකව ඡන්දය දුන්නේ ය.

දෙදින සංචාරයක් සඳහා ලන්ඩනයට ගොස් සිටි තුර්කි අගමැති ටායිප් එර්ඩොගාන් මෙසේ ප්‍රකාශ කලේ යෑ "අසල්වැසි රටක් ත්‍රස්තවාදීන්ට සුරක්ෂිත ක්ෂේම භූමියක් සම්පාදනය කරමින් සිටිනව නම් ... ජාත්‍යන්තර නීතිය යටතේ අපට අයිතීන් තියෙනවා, අප ඒ අයිතීන් යොදා ගන්නවා, ඒ සඳහා අප කිසි කෙනෙකුගෙන් අවසර ගත යුතු නෑ."

ඉරාක-තුර්කි දේශ සීමාවෙහි පවතින පිරිහෙන තත්ත්වය සහ වඩා පුලුල් යුද්ධයක් පිලිබඳ වැඩෙන තර්ජනය සම්බන්ධයෙන් එක්සත් ජනපදය සිදු කල ඉරාක ආක්‍රමනයට සහ වාඩි ලා ගැනීමට එර්ඩොගාන් දිගින් දිගට ම දොස් පැවරී ය.

"මට දකින්න පුලුවන් විදියෙ සාර්ථකත්වයක් නැහැ" යි ඔහු පැවසී ය. "දකින්න තියෙන්නෙ දසදහස් ගනන් ජනයා මරුමුවට පත් වෙන එක විතර යි. එතන තියෙන්නෙ යටිතල පහසුකම් සහ උපරි ව්‍යුහය බිඳ වැටුනු නිකම් ම නිකම් ඉරාකයක් විතර යි."

කුර්දි බෙදුම්වාදයේ නාමයෙන් ඉරානයට එරෙහිව ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල කිරීමේ දී පීකේකේහි සහෝදර සංවිධානයට සහාය දෙන ගමන්, එක්සත් ජනපදය පීකේකේහි මෙහෙයුම් නො තකා හැර සිටින බව තුර්කිය හොඳින් දනී.

මෑත ම පීකේකේ ප්‍රහාරය මිලිටරිමය පියවරයන් ගන්නා ලෙස ඉල්ලමින් විරුද්ධ පක්ෂ සංවිධානය කල උද්ඝෝෂන ඇවිලී ඒමට හේතු විය. "පීකේකේයත් එක්සත් ජනපදයත් හංග වේවා!" යි සටන් පාඨ කියමින් දහස් ගනන් ජනයා අන්කාරාහි පෙලපාලි ගියහ.

තුර්කිය පලි ගැනීම දෙසට යොමු වීම අනෙකුත් තැන්වල පවතින මිනීමරු ප්‍රචන්ඩත්වයෙන් ගැලවී සිටින ඉරාකයේ කලාපයක් අවුල් ජාලයක ගිල්වීමේ තර්ජනය මතු කරයි.

ඉරාකයෙහි වොෂින්ටනය සිදු කරන නව විජිතවාදී මැදිහත් වීම තුර්කියේ සහ ඉරානයේ දේශ සීමා හරහා පැතිර යමින් පවතින අතරවාරයේ, ඇෆ්ඝනිස්ථානයෙහි දිගින් දිගට ම සිදු වන යුද්ධය අසල්වැසි පකිස්ථානයේ දේශපාලන වෙඩි බෙහෙත් පීප්පයක් ගිනි ලන්නට බෙහෙවින් තර්ජනය කරමින් සිටී.

පසු ගිය බ්‍රහස්පතින්දා බෙනාසීර් භුතෝගේ රථ පෙලකට එරෙහිව එල්ල කල, 136 දෙනෙකු ඝාතනයට ලක් වූ සහ සිය ගනනකට තුවාල සිදු වූ දැවැන්ත බෝම්බ ප්‍රහාරය පකිස්ථානය තුල වඩාත් පුලුල් ලේ වැගිරීමක සහ සිවිල් යුද්ධයක ප්‍රාරම්භක පහර වීමට හොඳට ම ඉඩ තිබේ.

දූෂන චෝදනා මධ්‍යයේ දශකයකට පමන පෙර අගමැති ධුරයෙන් පහ කල භුතෝ, රටේ මිලිටරි පාලකයා වන ජනරාල් පර්වේස් මුෂාරෆ් සමග වොෂින්ටනය තැරැව්කාරකම් කල ගනුදෙනුවක කොටසක් ලෙස යලි පකිස්ථානයට කැඳවනු ලැබීන. මෙහි අරමුන වන්නේ, තලේබාන්වරුන් රැකවරනය සලසා ගෙන සිටින සහ මහජන සහාය ලබන ඇෆ්ඝනිස්ථානයට යාබද ගෝත්‍රික ජනයා වෙසෙන කලාප තුලට එක්සත් ජනපද හමුදාවන්ගේ ආක්‍රමනයට මග පාදන ගමන්, වැඩෙන මහජන නොසන්සුන්තාවෙන් එක්සත් ජනපද හිතැති පාලන තන්ත්‍රය ආරක්ෂා කෙරෙන බලය බෙදා ගැනීමේ එකඟතාවක් වර්ධනය කර ගැනීම යි.

ඇෆ්ඝනිස්ථානයෙහි ප්‍රතිරෝධය සහ පකිස්ථානයෙහි වැඩෙන අර්බුදය මැඩ ලීම සඳහා එක්සත් ජනපදය සහ එහි සන්ධානකරුවන් ගත් අසාර්ථක ප්‍රයත්නයේ දී ඒකාබද්ධ වීමේ ඇඟවුම් හිටපු ඉහල පෙලේ එක්සත් ජාතීන්ගේ නියෝජිතයෙකු වන පැඩී ඇෂ්ඩවුන් රොයිටර් පුවත් ඒජන්සිය සමග පසු ගිය සතියේ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක දී, පැහැදිලි කලේය.

"මා හිතන විදියට ඇෆ්ඝනිස්ථානයේ දී පරාජයට පත් වෙන එක ඉරාකයේ දී පරාජයට පත් වෙනවට වඩා නරක යි," ඇෂ්ඩවුන් කීවා ය. "ඒකෙන් අදහස් වෙන්නෙ පකිස්ථානය ඇද වැටෙන බවත් අපේ ම රටවල්වල ආරක්ෂාව සම්බන්ධයෙන් එය අභ්‍යන්තර වශයෙන් බරපතළ ඇඟවුම් අත් කර ගන්නා බව සහ විශාල පරිමානයේ වඩා පුලුල් ෂියා, සුන්නි කලාපීය යුද්ධයක් අවුලුවන බව ය."

"පලමු වන හා දෙවන ලෝක යුද්ධ යුරෝපා සිවිල් යුද්ධ හැටියට සමහරුන් හඳුන්වනවා. මා හිතන්නෙ මේකෙන් ඒ හා සමාන සිවිල් යුද්ධයකට ... ඒ පරිමානයේ යුද්ධයකට මුල පිරෙන්න පුලුවන්." ඇෂ්ඩවුන් තවදුරටත් පැවසුවා ය.

## මොස්කෝව සමග වැඩෙන ආතති

කලු මුහුදේ සිට අරාබි මුහුද දක්වා පරාසයක විහිදෙන ප්‍රදේශයක පිහිටි සැතපුම් 2,500ක වැඩි බිම් තීරුවක් තුලට එක්සත් ජනපද මිලිටරිය කඩා වැදීමේ තර්ජනය මෙම වර්ධනයන්ගෙන් මතු වේ. තුන්වන ලෝක යුද්ධය පිලිබඳව බුෂ්ගේ ප්‍රකාශයෙන් මූලිකව යොමු කෙරුන මොස්කෝවට පෙර නොවූ ආකාරයේ තර්ජනයක් ඉදිරිපත් කරමින් මෙම ප්‍රදේශයට පැරනි සෝවියට් සංගමයේ දකුනු කොටස ද ඇතුලත් වෙයි.

පසු ගිය බ්‍රහස්පතින්දා ජාතික පරිමානව රූපවාහිනිය ඔස්සේ විකාශනය වූ ජනාධිපති ව්ලැඩිමීර් පුටින්ගේ කතාවකින් එක්සත් ජනපදය සහ රුසියාව අතර පවතින ආතීන්ගේ නවමු ප්‍රකාශනයක් දැක ගත හැකිවිය. එහි දී ඔහු එක්සත් ජනපදය ඉරාකයෙහි කල මැදිහත් වීම රටේ තෙල් සම්පත් අල්ලා ගැනීමේ ප්‍රයත්නයක් ලෙස ගුනාංගීකරනය කල අතර, තමන්ගේ තෙල් සම්පත් සම්බන්ධයෙන් ද එය ම කරන්නට ඇමරිකාව දරන මොන යම් හෝ ප්‍රයත්නයක් වැලැක්වීමට අවශ්‍ය කරන මිලිටරිමය ශක්තිය රුසියාවට පවතින බවට අනතුරු ඇඟවී ය.

"දෙවියන්ට ස්තුති වේවා. රුසියාව කියන්නෙ ඉරාකය නෙවි" යි ඔහු කී ය. "තමන්ගේ ජාතික දේශ සීමාව ඇතුලත, ඒ විතරක් ද, ලෝකයේ අනෙකුත් කලාප ඇතුලතත් තමන්ගේ අවශ්‍යතාවන් ආරක්ෂා කර ගන්න තරම් එය ශක්තිමත්."

ටොපෝල්-එම් ප්‍රක්ෂේපන මිසයිලය අත්හදා බැලීම පිලිබඳ රූපවාහිනී වැඩ සටහනක් ද එම විකාශනයට ඇතුලත් වූ අතර, එය සැතපුම් දහස් ගනනක් දුරින් ශාන්තිකර ප්‍රදේශයෙහි පැවති යම් එල්ලයකට පහර දුන් බව කියැවුනි.

රුසියාවේ මිලිටරිය යලි ගොඩ නැගීම සඳහා බරපතල ආයෝජනයන් කරන බවට පුටින් ප්‍රතිඥා දුන්නේ ය. "අප අවධානය යොමු කරන්නෙ න්‍යෂ්ටික ත්‍රිකය වර්ධනය කිරීම ගැන විතරක් නෙවි. අනෙකුත් අවිආයුධ වර්ධනය කිරීම ගැනත් අප අපේ අවධානය යොමු කරනවා." පෝලන්තය සහ චෙක් සමූහාන්ඩුව තුල මිසයිල ආරක්ෂන පද්ධතියක් පිහිටුවීමේ යෝජනාව ඔස්සේ වොෂින්ටනය පෙරට ගිය හොත්, "රුසියානු පුරවැසියන්ගේ ආරක්ෂාව සහතික කිරීමට අප නිශ්චිත ම පියවර ගන්නවා" යි ද ඔහු අනතුරු ඇඟවී ය.

තුන්වන ලෝක යුද්ධය පිලිබඳව බුෂ් කල සැඳහුම පිලිබඳව විමසන ලදුව ධවල මන්දිර මාධ්‍ය ප්‍රකාශිකා ඩානා පෙරිනෝ අවධාරනය කලේ, ඔහු " එය උපමාවක් විදියට යොදා ගත්තා" විතර යි යනුවෙනි.

එය උපමාවක් නො ව වඩා පුලුල් විනාශයක් පිලිබඳ තර්ජනයක් බව ලෝකයේ පවත්නා බලශක්ති සම්පත්වලින් වැඩි කොටස ඇතුලත් වන මෙම කලාපය පුරා එක්සත් ජනපද මිලිටරි මැදිහත් වීම් මගින් මුදා හැර ඇති අස්ථාවරත්වය සහ ගැටුම් පිලිබඳව කෙරෙන අධ්‍යයනයකින් මැනවින් පැහැදිලි ය.

මෙම තර්ජනයට යටින් පවතින්නේ සතුරු ධනවාදී රාජ්‍යයන්ගේ ගැටෙන අවශ්‍යතා, සහ සියල්ලට මත් වඩා, ඉතා වැදගත් ස්වාභාවික සම්පත් සහ වෙලඳ පොලවල් අල්ලා ගැනීම සඳහා සිය මිලිටරිමය උත්තරීතර භාවය අයුතු ලෙස යොදා ගනිමින් එක්සත් ජනපද අධිරාජ්‍යවාදය යුරෝපයේ සහ ආසියාවේ සිය සතුරන්ට සාපේක්ෂව තමන් අත්විඳින ආර්ථික බිඳවැටීම සමහන් කර ගැනීමට දරන පරිශ්‍රමය යි.

මේ තත්ත්වයන් යටතේ, අනෙකුත් ප්‍රධාන බලයන්ගේ ප්‍රාන සම අවශ්‍යතාවන් කපා හෙලමින් වොෂින්ටනය වැඩි වැඩියෙන් සිදු කරන සාහසික මැදිහත් වීම් අනුව ගත් කල එක්සත් ජනපද අධිරාජ්‍යවාදය මානව වර්ගයා නව ලෝක යුද්ධයකට ඇද දමනු ඇත යන අනතුර මුලුමනින් ම සැබෑවකි.

මේ වනාහි බුෂ් විසින් විස්තාරනය කරන ලද සහ ඇමරිකානු පාලක සංස්ථාපිතයේ ප්‍රභූ කොටස් විසින් බදා වැලඳ ගන්නා ලද "පූර්ව භංග යුද්ධය" පිලිබඳ මතවාදයේ නො වැලැක්විය හැකි තර්කනය යි.

මේ එක්සත් ජනපද පාලක ප්‍රභුව තුල ගෝලීය යුද්ධයක් කරා වන හැරීමට එරෙහිව අව්‍යාජ දේශපාලනික විරුද්ධත්වයක් නො පවතී. ප්‍රදර්ශනාත්මක විරුද්ධ පක්ෂය වන ඩිමොක්‍රැටිකයෝ, ඉරානයේ ප්‍රධාන ආරක්ෂක බලකාය "ත්‍රස්තවාදී සංවිධානයක්" ලෙස හංවඩු ගසමින් යෝජනාවක් සම්මත කිරීමටත් එමගින් තවත් ජාතියක් මත අප්‍රකුපිත ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා දේශපාලන ව්‍යාජයක් සම්පාදනය කිරීමටත් එක්සත් ජනපද සෙනේට් සභාව තුල දී රිපබ්ලිකානුවන් සමග එක් වන ගමන් ඉරාක සහ ඇෆ්ඝනිස්ථාන යුද්ධවලට දිගින් දිගට ම අරමුදල් සපයා තිබේ.

මිලියන සිය ගනනකගේ ජීවිතවලට තර්ජනය කරන වඩා පුලුල් සහ වඩා විනාශකාරී යුද්ධයක සැබෑ සහ වැඩෙමින් පවතින අනතුරට පිලිතුරු දිය හැක්කේ යුද්ධය සහ එය නිර්මානය කරන ධනවාදී පද්ධතිය අවසන් කරන පොදු සමාජවාදී ක්‍රියා මාර්ගයක පදනම මත එක්සත් ජනපදය තුල සහ ජාත්‍යන්තරව කම්කරු පන්තිය ස්වාධීනව බලමුලු ගැන්වීමෙන් පමනකි.

© www.wsws.org